ගැටුම්වල බලපෑමට ලක්වූ ප්‍රදේශවල හදිසි අවශ්‍යතා ව්‍යාපෘතියේ (සීඒආර්ර්) (ඒ සංරචකය) - 2013

-----------------------------------------------------------------------------------------------------

ගැටුම්වල බලපෑමට ලක්වූ ප්‍රදේශවල හදිසි අවශ්‍යතා ව්‍යාපෘතියේ (සීඒආර්ර්)(ඒ සංරචකය) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රී ලං ර) සහ ආසියානු සංවර්ධන බැංකුව (ආසංබැ) අතර 2010 ජුනි 07 දින එළඹි අංක 2626 - එස් ආර් අයි දරන ණය ගිවිසුමේ 2 උපලේඛනයේ 11 ආ වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

--------------------------------------------------------------------------------

ණය ගිවිසුම අනුව, එවකට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ ප්‍රතිපත්ති සැලසුම්, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, උතුරු පළාත් සභාවේ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව හා පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ ගැටුම් වල බලපෑමට ලක්වූ ප්‍රදේශවල ජීවනෝපාය ආර්ථික යටිතල පහසුකම් සහ පරිපාලන හා නිතී සේවා ප්‍රතිස්ථාපනය කිරීම හා වැඩිදියුණු කිරීමයි. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ‘ඒ’ සංරචකය සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 74.49 ක් වන අතර ඉන් එජඩො මිලියන 67.26 ක් එනම් මුළු පිරිවැයෙන් සියයට 89 ක් මූල්‍යායනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි එජඩො මිලියන 7.23 ක් එනම් සියයට 11 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යායනය කිරීමට නියමිතය. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 ජුනි 07 දින ආරම්භ කරන ලද අතර 2013 ජුනි 30 වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි.

1.3 ව්‍යාපෘතියේ කාර්යයන්

-----------------------------

ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ‘ඒ’ සංරචකයට අදාළ කාර්යයන් පහත සාරාංශ කර දැක්වේ.

| | | |
|---|---|---|
| 1 කොටස | - | කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ආසන්න වශයෙන් කිලෝමීටර් 100 ක පළාත් මාර්ග පුනරුත්ථාපනය කිරීම. |
| 2 කොටස | - | උතුරු පළාතේ මහ නගර සභා හා නාගරික මාර්ග, ආසන්න වශයෙන් කිලෝමීටර් 100 ක් සහ උතුරු මැද පළාතේ යාබද ගම්වල ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය කිරීම. |
| 3 කොටස | - | උතුරු පළාතේ ආසන්න වශයෙන් කිලෝමීටර් 65 ක ජාතික මාර්ග (බී වර්ගය) පුනරුත්ථාපනය කිරීම. |

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

2. විගණන විෂය පථය හා මතය සඳහා පදනම

---------------------------------------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම් , මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම්, ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර සාධාරණව ඉදිරිපත් කර තිබුණේද යන බව.

(උ) අග්‍රිම අරමුදල් ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට කරන ලද ඌනපූරණයන් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලබන පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ල ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඌ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලව කටයුතු කර තිබුණේද යන බව.

3. මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර, මාගේ මතය වනුයේ

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විශේෂ (ඩොලර්) ගිණුමෙන් ආපසු ගැනීම් සහ එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණය සඳහා වූ කරන ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

4. මූල්‍ය ප්‍රකාශන

------------------

4.1 මූල්‍ය කාර්යසාධනය

-------------------------

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.3,500,649,589 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම සහ ඉකුත් වර්ෂය සඳහා වියදම හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| **වියදම් විෂයය** | **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම** | | **2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම** |
|---|---|---|---|
| | **2013** | **2012** | |
| | රු. | රු. | රු. |
| සිවිල් වැඩ | 3,298,020,502 | 2,291,866,077 | 6,272,047,574 |
| උපකරණ | - | 19,982,886 | 55,555,219 |
| උපදේශක සේවා | 145,734,535 | 151,476,107 | 406,859,432 |
| වර්ධක මෙහෙයුම් පිරිවැය | 30,401,900 | 37,655,435 | 105,235,694 |
| බැඳීම් ගාස්තු | 26,492,652 | 23,905,610 | 66,824,774 |
| | 3,500,649,589 | 2,524,886,115 | 6,906,522,693 |

4.2 විශේෂ ඩොලර් ගිණුම

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළ විශේෂ ඩොලර් ගිණුමේ මෙහෙයුම් හා 2013 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ පැවති ශේෂය පහත දැක්වේ.

| | | එජඩො | රු. |
|---|---|---|---|
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | | 2,861,840 | 363,913,910 |
| එකතු කළා:- | ඌනපූර්ණයන් | 92,432 | 11,778,267 |
| | ප්‍රත්‍යාගණන වාසිය | - | 2,387,110 |
| | | 2,954,272 | 378,079,287 |
| අඩුකළා :- | ආපසු ගැනීම් | 2,952,042 | 377,787,624 |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | | 2,230 | 291,663 |

5. විගණන නිරීක්ෂණ

5.1 පැහැදිලි නොකළ වෙනස්කම්

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.15,843,478 ක් වූ ලැබිය යුතු ශේෂ මූල්‍ය ප්‍රකාශනවල සටහන් යටතේ දැක්වෙන රු.6,665,458 ක් වූ අනුරූපී සංඛ්‍යාව සමඟ එකඟ නොවේ. වෙනසට හේතුව විගණනයට පැහැදිලි කර නොතිබුණි.

5.2 විගණනය සඳහා සාක්ෂි නොවීම.

උපදේශක විසින් කාර්තුමය හා අර්ධ වාර්ෂික ප්‍රගති වාර්තා පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

6. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

6.1 අරමුදල් උපයෝජනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම තහවුරු කර ගැනීම සඳහා ව්‍යාපෘති සංරචකයන් හා මූල්‍ය සහ භෞතික ඉලක්ක සමඟ අරමුදල් වෙන්කිරීම ආවරණය වන පරිදි මාසිකව, කාර්තුමය හා වාර්ෂිකව වගකීම් දක්වමින් ව්‍යාපෘතියේ සමස්ත කාලපරිච්ඡේදය ආවරණය වීම සඳහා විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුය. කෙසේ වුවද එම සැලැස්ම පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.තවද නිවැරදි කිරීම් ක්‍රියාමාර්ග ගැනීම සඳහා සහ දක්වා ඇති අරමුණු ඉටු කරගැනීම සඳහා අවශ්‍ය වෙනස්කම් කිරීමට ව්‍යාපෘතියේ ප්‍රගතිය සමස්තයක් ලෙස ඇගැයීමට නොහැකි විය.

(ආ) ව්‍යාපෘති යෝජනාවට අනුව, වියදම් විෂයයන් 05 ක් යටතේ ව්‍යාපෘතියේ 'ඒ' සංරචකය සඳහා රු.මිලියන 8,648 ක වෙන් කිරීම් කර තිබුණි.වෙන්කිරීම් සහ 2013 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය පිළිබඳ විස්තරාත්මක විශ්ලේෂණයක් පහත දැක්වේ.

| වියදම් විෂයය | වෙන්කරන ලද මුදල | 2013 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|
| | | උපයෝජනය කළ මුදල | උපයෝජනය නොකළ මුදල |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| සිවිල් වැඩ | 7,934 | 6,272 | 1,662 |
| උපකරණ | 70 | 56 | 14 |
| උපදේශක සේවා | 410 | 407 | 03 |
| වර්ධක පිරිවැය | 161 | 105 | 56 |
| බැඳීම් ගාස්තු | 73 | 67 | 06 |
| | 8,648 | 6,907 | 1,741 |

6.2 භෞතික කාර්ය සාධනය

ව්‍යාපෘතියේ 'ඒ' සංරචකයේ කටයුතු, ජාතික මාර්ග පුනරුත්ථාපනය හා පළාත් මාර්ග පුනරුත්ථාපනය යන සංරචක දෙක යටතේ සිදුකර තිබුණි. උතුරු පළාතේ ජාතික මාර්ග පුනරුත්ථාපනය කිරීම යටතේ ප්‍රදානය කරන ලද සියලුම කොන්ත්‍රාත් සහ පළාත් මාර්ග පුනරුත්ථාපනය කිරීම සඳහා ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් 33 කින් කොන්ත්‍රාත් 31 ක් 2013 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන්ම නිමකර තිබුණි. කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්ය සාධනය හේතුවෙන් අනෙක් කොන්ත්‍රාත් දෙකෙහි ගිවිසුම් අවසන් කර තිබුණි. පළාත් මාර්ග පුනරුත්ථාපනය කිරීම සඳහා ව්‍යාපෘතිය විසින් ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් පිළිබඳ පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිරන්තර ලක්ෂණයක් ලෙස, ව්‍යාපෘතිය විසින් ප්‍රදානය කරන කොන්ත්‍රාත් යටතේ වැඩ විෂය පථය වෙනස් කර තිබුණි. උතුරු පළාතේ පළාත් මාර්ග පුනරුත්ථාපනය කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද කොන්ත්‍රාත් 33 කින් වැඩ විෂය පථයේ විචලනයන් හේතුවෙන් කොන්ත්‍රාත් 06 ක මූලික පිරිවැය රු.123,572,237 කින් වැඩි වී තිබූ අතර, කොන්ත්‍රාත් 27 ක පිරිවැය රු.87,720,855 කින් අඩු වී තිබුණි. ඒ අනුව මාර්ග මැනීම සිදුකිරීම හා ප්‍රමාණ පත්‍ර පිළියෙල කිරීම ආදී මූලික වැඩ විධිමත්ව සිදුකර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) මන්තායි - පරප්පුකඩන්දන් මාර්ගයේ මීටර් 11,850 ක මාර්ග වැඩවලින් මීටර් 11,550 ක මාර්ග වැඩ පමණක් නිම කර තිබුණි. කෙසේවුවද සිදුකරන ලද වැඩ පිළිබඳ සැලකීමෙන් තොරව මුළු ගෙවීම වූ රු.5,911,274 ක මුදල කොන්ත්‍රාත්කරුට මුදාහැර තිබුණි.

(ඇ) කොන්ත්‍රාත්තුවේ පොදු කොන්දේසිවල 4.9 වගන්තිය අනුව, ඉදිකිරීම් අභ්‍යාස හා පුහුණු ආයතනයේ මාර්ග සහ පාලම් ඉදිකිරීම් හා නඩත්තු කිරීම සඳහා අත්පොතේ දක්වා ඇති පරිදි කොන්ත්‍රාත්කරු තත්ත්ව සහතික ක්‍රමය පිළිපැදිය යුතුය. කෙසේ වුවද විගණකවරුන් විසින් කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණයන්හි දී අඩු උෂ්ණත්වයක් හා මතුපිට තෙත සහිත වැසි කාලගුණ තත්ත්වයක් යටතේ මවුන්ට් කැමල් මාර්ගයේ ඇස්පල්ට් ඇතිරීම, මහත්මකන්ට් අතුරු මාර්ගයේ " ඇග්‍රිගේට් බේස් කෝස් තට්ටුව " තදකිරීම සඳහා පරීක්ෂණ නොකිරීම හා අබූබකර් විදී මාර්ගයේ මාර්ග අයින් පුළුල් කිරීමේ කාර්යය සඳහා සුදුසු නොවන ද්‍රව්‍ය යොදාගැනීම වැනි තත්ත්ව සහතික පිළිපැදීමේ බොහෝ අඩුපාඩු නිරීක්ෂණය විය.

(ඈ) උපදේශක සේවා ගිවිසුම් අනුව, දෝෂ වගකීම් කාලය තුළදී දෝෂ නිවැරදි කිරීම සඳහා සේවය සැපයීමට උපදේශකවරයා වගකිව යුතුය. කෙසේ වුවද උයිලම්කුලම් - අට්කට්ටිවෙලි මාර්ගය, තුනුක්කායි - තෙමියකුලම් මාර්ගය, මාන්තායි - පරප්පුකඩන්තාන් මාර්ගය සහ

කොකාවිල් සිට තුනුක්කායි මාර්ගයේ සපත්තු පාලම් පුනරුත්ථාපනය කිරීමේදී නිරීක්ෂණය වූ අඩුපාඩු නිවැරදි කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඉ) ව්‍යාපෘතිය සපයන ලද අරමුදල්වලින් කොන්ත්‍රාත්කරු විසින් රු.මිලියන 15 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කරන ලද යතුරු පැදි, මැනීම් උපකරණ, පරිගණක හා රසායනාගාර උපකරණ ආදී වත්කම් ව්‍යාපෘතියට අයත් වත්කම් ලෙස වාර්තා කර නොතිබුණි. තවද, ලාභයෙන් සියයට 15 ක් හා පොදුකාර්ය පිරිවැය ආන්තිකයද කොන්ත්‍රාත්කරු විසින් අයකර තිබුණි.

6.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු
---------------------------------
පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උපදේශක සේවා ගිවිසුම අනුව, උපදේශක විසින් ඔහු භාරයේ තිබූ මුල් ලියකියවිලි කොන්ත්‍රාත්තුව අවසන් වීමෙන් පසුව, ව්‍යාපෘතියට භාරදිය යුතුය. කෙසේ වුවද ව්‍යාපෘතියේ නිමකරන ලද කොන්ත්‍රාත්තුවලට අදාළ භුවමාරු ලිපිගොනු, ලියකියවිලි, ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ඉල්ලීම් කිහිපයක් කරන ලද නමුත් උපදේශක විසින් භාර දී නොතිබුණි.

(ආ) පොදු කොන්ත්‍රාත් කොන්දේසිවල 4.6.2 වගන්තිය අනුව, නිමකිරීමේ දිනය දීර්ඝ කර තිබේ නම් පමණක් ප්‍රමාද ගාස්තු ආපසු ගෙවිය හැකිය. කෙසේ වුවද නිමකිරීමේ කාලය දීර්ඝ කර නොතිබුණද මන්නායි - පරප්පුකඩන්දන් මාර්ගය පුනරුත්ථාපනය කිරීමේ ප්‍රමාදයන් මත අයකර තිබූ රු.27,332,509 ක් වූ ප්‍රමාද ගාස්තු ආපසු ගෙවා තිබුණි. තවද කොන්ත්‍රාත්තුවේ කාලය දීර්ඝ කිරීමෙන් තොරව කිලිනොච්චිහි මුරුකන්ඩි - අක්කරයාන්කුලම් මාර්ගය පුනරුත්ථාපනය කිරීම මත අවසාන බිල්පත්‍රයෙන් අයකරගන්නා ලද රු.1,287,056 ක ප්‍රමාද ගාස්තුද ආපසු ගෙවා තිබුණි.

(ඇ) පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් වවුනියා හා කිලිනොච්චි හි නිල නිවාස අලුත්වැඩියා කිරීම් වැඩ, මාර්ග පුනරුත්ථාපන වැඩ විෂය පථයට ඇතුළත් නොවුවද ව්‍යාපෘතිය විසින් රු.මිලියන 4.2 ක පිරිවැයකට අලුත්වැඩියා කර තිබුණි.

(ඈ) එකතු කළ අගය මත බදු ගෙවීම් කාර්යය සඳහා වලංගු නොවූ ලියාපදිංචි අංකයන් හිමි කොන්ත්‍රාත්කරුවන් 05 දෙනෙකුට රු.208,425,950 ක් වූ එකතු කළ අගය මත බදු ගෙවා තිබූ බව විගණනයේදී අනාවරණය විය.